ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,ශ්‍රී ලංකාව
பாதுகாப்பு தலைமையக கட்டிடம் ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே இலங்கை
Defence Headquarters Complex , Sri Jayawardenepura, Kotte, Sri Lanka Website : www.defence.lk

තැ.පෙ / த.பெ / P.O. Box } 572
දුරකථන / தொலைபேசி / Telephone } 2430860-9 / 2430870-8
ලේකම් / செயலாளர் / Secretary } දුර/தொ/Tel: 0112381154 / ෆැක්ස්/தொ/Fax: 0112541529 / ඊ තැපැල/மி.அ/Email: secdefence@defence.lk

මගේ අංකය / எனது இல / My No } MOD/NID/ED/OUT/01 (Vol 05 - 218 )

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2024 අගෝස්තු 05 දින

180

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආගමික කටයුතු)
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

<u>ආනයනය කරනු ලබන ඉස්ලාම් ආගමික පොත්පත් රේගුව හරහා නිදහස් කිරීම</u>

යොමුව: MBRCA/07/MUSLIM/QURANS හා 2024.07.25 දිනැති ඔබ අමාත්‍යාංශ ලිපිය

1. යොමුගත ලිපිය මගින් සෞදි අරාබියේ සිට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත පරිත්‍යාග වශයෙන් ලබාදී ඇති ඉස්ලාම් ආගමික ග්‍රන්ථ ගුණත්ව වර්ග 04 අතරින් ශුද්ධ වූ අල් කුර්ආන් ග්‍රන්ථය (පිටපත් 25000) සඳහා පමණක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්මේන්තුව යටතේ වන ග්‍රන්ථ සමාලෝචන කමිටුව විසින් අන්තවාදි කරුණු අන්තර්ගත නොවන බවට නිර්දේශ සහිතව මෙම අංශය වෙත යොමුකර ඇති අතර, එම නිර්දේශයන්ට අනුව එම ග්‍රන්ථය සඳහා පමණක් රේගුව වෙතින් නිදහස් කිරීම සම්බන්දයෙන් මෙම අමාත්‍යාංශයේ විරුද්ධත්වයක් නොමැති බවට දන්වා සිටිමි.

2. මෙය ඔබගේ දැනගැනිමට හා නිසි කටයුතු සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

ජේ ආර් කුලතුංග ආර්එස්පී
මේජර් ජෙනරාල්
ජාතික බුද්ධි ප්‍රධානි

certified as true copy.

13/08/2024

R. N. Kumari
Additional Secretary (Religious Affairs)
Ministry of Buddhasasana,
Religious and Cultural Affairs
No. 135, Srimath Anagarika Dharmapala Mawatha

බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය
ආගමික කටයුතු අංශය
05 AUG 2024
Ministry of Buddhasasana

ආරක්ෂක උපදෙස: මෙම ලියවිල්ල ආරක්ෂක අමාත්‍යාංශයේ ජාතික බුද්ධි අංශ කාර්යාලය සතු සුවිශේෂී දේපලකි. එය ඔබ/ඔබ දෙපාර්තමේන්තුව/ආයතනය කෙරෙහි වන විශ්වාසනීය භාවය මත ඔබගේ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ප්‍රයෝජනය සඳහා පමණක් ලබාදී ඇති රහස හා වරප්‍රසාද ලත් ලියවිල්ලකි. ජාතික බුද්ධි ප්‍රධානියාගේ නිසි අවසරයකින් තොරව මෙම ලියවිල්ලෙහි අන්තර්ගත කරුණු මුළු මනින්ම හෝ කොටසක් වශයෙන් හෝ වෙනත් පාර්ශවයන් වෙත ලබාදීම, පිටපත් කිරීම, ආරක්ෂක විග්‍රහයන් වෙනස් කිරීම, හෝ බෙදාහැරීම සපුරා තහනම් වේ. මෙම ලියවිල්ල ලද යම් පාර්ශවයකට ඉහත කොන්දේසි වෙනස් කරගත යුතු නම් ආරක්ෂක අමාත්‍යාංශයේ ජාතික බුද්ධි අංශ කාර්යාලය දැනුවත් කර අවසර ලබාගත යුතුවේ.

(81)

MBRCA/07/MUSLIM/QURANS 2024.08.07

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව
කොළඹ - 11.

<u>ආනයනය කරනු ලබන ඉස්ලාම් ආගමික පොත්පත් රේගුව හරහා නිදහස් කිරීම.</u> (80)

උක්ත කරුණ සම්බන්ධයෙන් ජාතික බුද්ධි ප්‍රධානිගේ අංක MOD/NID/ED/OUT/01 (VOL 05 -218) හා 2024.08.05 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව සෞදි අරාබියේ සිට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත පරිත්‍යාග වශයෙන් ලබා දී ඇති ශුද්ධ වූ අල් කුර්ආන් ග්‍රන්ථ (අරාබි භාෂා පමණක්) පිටපත් - 25000 සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ වන ග්‍රන්ථ සමාලෝචන කමිටුව විසින් අන්තවාදී කරුණු අන්තර්ගත නොවන බවට සිදුකර ඇති නිර්දේශයට අනුව, එම ග්‍රන්ථයන්හි ජාතික ආරක්ෂාවට හෝ ආගමික සංහිඳියාවට බලපාන කරුණු අන්තර්ගතව නොමැති බැවින් එම ග්‍රන්ථ පමණක් රේගුව වෙතින් නිදහස් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දී ඇත.

03. ඒ අනුව එම ග්‍රන්ථ රේගුව වෙතින් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එච්.එම්.බී.පී.හේරත්
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

O/C

පිටපත -

1. අධ්‍යක්ෂ, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - කරු.ඉහත සඳහන් පරිදි ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය අනුව හා ඔබේ අංක MRCA/R/09/NOL/2024/V හා 2024.08.07 දිනැති ලිපිය අනුව ශුද්ධ වූ අල් කුර්ආන් ග්‍රන්ථ නිශ්කාෂණය කිරීමට අදාල සමාලෝචන කමිටුවේ සාමාජිකයන් සහ ඔබ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ග්‍රන්ථ නිශ්කාෂණය කිරීම සඳහා (79)

Certified as true copy.

13/08/2024

Additional Secretary (Religious Affairs)
Ministry of Buddhasasana,
Religious and Cultural Affairs
No. 135, Srimath Anagarika Dharmapala Mawatha,
Colombo 07.